කම්කරු අමාත්‍යාංශය
தொழில் அமைச்சு
MINISTRY OF LABOUR
හයවන මහල, "මෙහෙවර පියෙස", නාරාහේන්පිට, කොළඹ 05, ශ්‍රී ලංකාව.
6 ஆவது தளம், "மெஹெவர பியெச", நாரஹேன்பிட்டி, கொழும்பு 05, இலங்கை.
6th Floor, " Mehewara Piyesa", Narahenpita, Colombo 05, Sri Lanka.

මගේ අංකය / எனது இல / My No. ML/2025/03 | ඔබේ අංකය / உமது இல / Your No. | දිනය / திகதி / Date 2025.01.09

**මාධ්‍ය නිවේදනයයි**

**<u>සමාජ මාධ්‍ය ඔස්සේ සංසරණය වන දැන්වීමක් පිළිබදවයි.</u>**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය යන පාඨය යොදා ගනිමින් සමාජ මාධ්‍ය ඔස්සේ සංසරණය වන දැන්වීමක් පිළිබදව කරුණු පැහැදිලි කිරීමට කැමැත්තෙමි.

අදාළ දැන්වීමට අනුව රජය විසින් අනුමත කරන ලද අර්ධ කාල වැඩ යනුවෙන් දක්වා ඇති අතර දෛනිකව ශ්‍රී ලංකා රුපියල් පනස් පන්දහසක ආදායමක් උපයාගත හැකි බව ද එහි සඳහන්ව ඇත.

ඊට අමතරව මාර්ගගත සම්මුඛ පරීක්ෂණ පවත්වන බවත් දෛනික වැටුප් ගෙවන බවත් එහි දක්වා තිබේ.

එම නිවේදනයට අදාලව මාර්ගගත රැකියා අපේක්ෂකයන්ගේ ජීව දත්ත තොරතුරු ඇතුළත් කරන ලෙසද සඳහන්ව ඇත.

කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යාංශය යන පාඨය භාවිත කරමින් සහ රාජ්‍ය ලාංඡනය යොදා ගනිමින් නිර්මාණය කර ඇති මෙම දැන්වීම සම්පූර්ණයෙන්ම සාවද්‍ය සහ අසත්‍ය බවත් එවැනි දැන්වීමක් කම්කරු අමාත්‍යංශය විසින් පළ කර නොමැති බව කම්කරු නියෝජ්‍ය අමාත්‍ය මහින්ද ජයසිංහ මහතා අවධාරණය කරයි.

නව රජයේ අමාත්‍යාංශ විෂය පථයන්ට අනුව විදේශ රැකියා විෂය පථය කම්කරු අමාත්‍යාංශයට අයත් නොවන බවද ඒ මහතා පෙන්වා දෙයි.

මෙවැනි අසත්‍ය සහ සාවද්‍ය දැන්වීම් පළකිරීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටද කටයුතු යොදා ඇත.

එම ව්‍යාජ සහ අසත්‍ය දැන්වීමට අදාළව ඔබේ පුද්ගලික තොරතුරු ලබාදීමෙන් වළකින ලෙස කම්කරු නියෝජ්‍ය අමාත්‍ය මහින්ද ජයසිංහ මහතා ජනතාවගෙන් ඉල්ලා සිටියි.

ස්තූතියි,

බුද්ධි ගුණසේකර
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ මාධ්‍ය ලේකම්
කම්කරු අමාත්‍යාංශය
7 වන මහල, "මෙහෙවර පියෙස",
නාරාහේන්පිට, කොළඹ 05.